සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved/

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

**ඉතිහාසය I**
வரலாறு I
History I

*පැය එකයි*
*ஒரு மணித்தியாலம்*
*One hour*

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

**1.** 'වංසත්ථප්පකාසිනී' කවර වංසකථාවකට ලියන ලද ටීකාවක් ද?
(1) දීපවංසය (2) මහාවංසයේ මුල් කොටස
(3) ථූපවංසය (4) බෝධිවංසය

**2.** පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකථා ලියැවී ඇත්තේ,
(1) පුස්කොළ පොත්වල ය. (2) ගල් පුවරු මත ය.
(3) කටාරම්වල ය. (4) රන් සහ තඹපත්වල ය.

**3.** තම අත්දැකීම් ඇසුරෙන් උඩරට රාජ්‍යය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් ලියා ඇත්තේ,
(1) බැල්ඩියස් ය. (2) රිබෙයිරෝ ය.
(3) රොබට් නොක්ස් ය. (4) ක්වේරෝස් පියතුමා ය.

**4.** පොහොය දිනවල වෙළෙඳාම් කළ අයට දඩ නියම කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය මින් කුමක් ද?
(1) මිහින්තලා පුවරු ලිපිය (2) වේවැල්කැටිය ශිලා ලිපිය
(3) ගල්පොත ශිලා ලිපිය (4) සොරබොරවැව ටැම් ලිපිය

**5.** පුරවැසියකු ලෙස ඉතිහාස දැනුම වඩාත් ම ඵලදායි ලෙස භාවිත කළ යුතු වන්නේ,
(1) අතීත ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය හැදෑරීම සඳහා ය.
(2) පැරණි තාක්ෂණික දැනුම නවීකරණය කර භාවිතයට ගැනීම සඳහා ය.
(3) අතීතයේ කළ වැරදි නැවත සිදු නොකිරීම සඳහා ය.
(4) අතීතය තුළින් වර්තමානය අවබෝධ කරගෙන අනාගතය හැඩගසා ගැනීම සඳහා ය.

**6.** ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ මින් කවර කරුණක් නිසා ද?
(1) මතු පරපුරට පෙන්විය යුතු නිසා ය.
(2) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතු වන නිසා ය.
(3) සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතු වන නිසා ය.
(4) අතීත පාලකයන්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබා ගත හැකි නිසා ය.

**7.** ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුව කාල නිර්ණය අනුව වසර,
(1) එක් ලක්ෂ විසිපන් දහසක් පැරණි ය. (2) අසූ දහසක් පැරණි ය.
(3) තිස්අට දහසක් පැරණි ය. (4) විසිඅට දහසක් පැරණි ය.

**8.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ජීවන රටාව පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන සාධක බොහොමයක් ලැබී ඇති ස්ථානයක් ලෙස සැලකෙනුයේ,
(1) රිටිගල ය. (2) කදුරුගොඩ (කන්දරෝඩේ) ය.
(3) පාහියන්ගල ය. (4) කතරගම ය.

EXAMMOOD.LK

**9.** ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.
(3) මුල් ඓතිහාසික යුගයේ දී ය. (4) ඓතිහාසික යුගයේ දී ය.

**10.** දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක් ද?
(1) පසෙහි සාරවත් බව වැඩි වීම
(2) දඩයමට සුදුසු සතුන් හිඟවීම
(3) පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම
(4) ජන සංඛ්‍යාව වැඩි වීම හා ව්‍යාප්ත වීම

**11.** මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය මින් කුමක් ද?
(1) ගම් වැව්වල ව්‍යාප්තිය (2) ලෙන්වල පිහිටීම
(3) රතු-දුඹුරු පස්වල ව්‍යාප්තිය (4) තැනිතලා බිම්වල ව්‍යාප්තිය

**12.** පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ රජතුමා වන්නේ,
(1) පණ්ඩුකාභය ය. (2) දේවානම්පිය තිස්ස ය. (3) දුටුගැමුණු ය. (4) වසභ ය.

**13.** අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ප්‍රබල සාධකයක් වන්නේ,
(1) පැරණි වෙදපොත් මෙරට භාවිතයේ පැවතීමයි.
(2) පුරාවිද්‍යාත්මක කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීමයි.
(3) වෛද්‍යවරුන් ලෙස ප්‍රසිද්ධියට පත් රජවරු පිළිබඳව වංසකථාවල සඳහන් වීමයි.
(4) අතීත රෝහල් ගොඩනැගිලිවල නටබුන් හමුවීමයි.

**14.** ස්ථාන කිහිපයකින් ම අමුණු බැඳ දිගු දුරකට ඇළ මාර්ග මගින් ජලය ගෙනයාම සඳහා යොදා ගත් ගංගාව මින් කුමක් ද?
(1) මල්වතු ඔය (2) කලා ඔය (3) යාන් ඔය (4) මහවැලි ගඟ

**15.** තෙවරක් ම මෙරට පාලනය කළ රැජිනිය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ මින් කවර තැනැත්තියක් ද?
(1) ලීලාවතී (2) කල්‍යාණවතී (3) සුගලා (4) චූල සීවලී

**16.** කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා තමාගේ ශිලා ලිපි බොහොමයක ම භාවිත කළ රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය මින් කුමක් ද?
(1) දේවත්ව (2) බෝධිසත්ව (3) පර්වතරාජ (4) චක්‍රවර්ති

**17.** අතීතයේ දී 'ගව්ව' යන මිනුම භාවිත කරන ලද්දේ,
(1) කාලය මැනීමට ය. (2) දුර මැනීමට ය. (3) බර මැනීමට ය. (4) වපසරිය මැනීමට ය.

**18.** 'දකපති' යනුවෙන් සෙල්ලිපි මූලාශ්‍රවල සඳහන් වන්නේ,
(1) ජල බද්දකි. (2) ධාන්‍ය බද්දකි. (3) මත්ස්‍ය බද්දකි. (4) තොටුපොළ බද්දකි.

**19.** පහත ප්‍රකාශ සලකන්න.
- නගර නිර්මාණය ජ්‍යාමිතික සැලසුම් ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයකට පරිවර්තනය වීම.
- නගර මහා පරිමාණ ස්වරූපයක් පෙන්නුම් නොකිරීම.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ නගර යුගලය වන්නේ මින් කුමක් ද?
(1) අනුරාධපුරය හා පොළොන්නරුව
(2) අනුරාධපුරය හා දඹදෙණිය
(3) දඹදෙණිය හා යාපහුව
(4) පොළොන්නරුව හා කුරුණෑගල

**20.** ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දක්වා ඇත.
A – පන්සිය පනස් ජාතක කථා පොත සිංහලට පරිවර්තනය කිරීම
B – උඩරට සාමන්ත පාලක 'ජෝතිය සිටුවරයා' කැරැල්ලක් ඇති කිරීම
C – චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම
D – අරාබි ජාතික ඉබන් බතූතා ලංකාවට පැමිණීම

ඉහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
(1) A, C, B හා D (2) C, A, D හා B (3) C, D, A හා B (4) D, C, A හා B



EXAMMOOD.LK

**21.** මහනුවර රාජධානිය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) රටේ ඉහළ ම පාලන හා අධිකරණ බලතල රජතුමා සතු විය.
(2) පාලන කටයුතු සිදු වූයේ සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුව ය.
(3) සමාජ සම්බන්ධතා හා විවාහ කටයුතු කුල ක්‍රමය අනුව සිදු විය.
(4) රටේ සියලු ම පුරවැසියන් නීතිය හමුවේ සමාන ලෙස සැලකිණි.

**22.** ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට යාපනයේ සිටි පාලකයා කවුරුන් ද?
(1) සංකිලි (2) පරරාජසේකරම් (3) පුවිරාජපණ්ඩරම් (4) එදිරිමාන්නසිංහම්

● පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරින් **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ස්ථානය | හමුදා ප්‍රධානියා |
|---|---|---|
| A - පළමුවන විමලධර්මසූරිය | D - රන්දෙනිවෙල | G - දියෝගු ද මෙලෝ |
| B - පළමුවන රාජසිංහ | E - දන්තුරේ | H - කොන්ස්තන්තීනු ද සා |
| C - දෙවන රාජසිංහ | F - මුල්ලේරියාව | J - පේරෝ ලෝපේස් ද සූසා |

**23.** රන්දෙනිවෙල සටනට සම්බන්ධ වූ උඩරට රජතුමා සහ පෘතුගීසි හමුදා ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා G (2) B හා H (3) C හා H (4) C හා J

**24.** පළමුවන විමලධර්මසූරිය රජතුමා පෘතුගීසීන් සමග සටන් කළ ස්ථානය හා එහිදී පෘතුගීසි හමුදාව මෙහෙයවූ ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) D හා G (2) E හා H (3) E හා J (4) F හා G

**25.** රජතුමාට පුතෙකු නොසිටි විට බිසවගේ සහෝදරයාට රාජ්‍ය උරුමය හිමිකර දීමේ සම්ප්‍රදාය අනුගමනය කළේ පහත සඳහන් කවර වංශයකට අයත් පාලකයන් විසින් ද?
(1) මෞර්ය (2) ලම්බකර්ණ (3) කාලිංග (4) නායක්කර්

**26.** ලන්දේසීහු උඩරට රජවරුන් සමග කටයුතු කිරීමේ දී බොහෝ දුරට ගැටුම් ඇතිකර ගැනීමෙන් වැලකී සිටීමට ප්‍රධාන හේතුව මින් කුමක් ද?
(1) උඩරට රජවරුන් අමනාප කර ගැනීම තම වෙළෙඳ කටයුතුවලට බාධාවක් විය හැකි නිසා
(2) උඩරට රජවරුන්ගේ යුධ ශක්තිය හමුවේ ලන්දේසි යුධ බලය දුර්වලව පැවති නිසා
(3) වියදම් අඩු කර ගැනීම ලන්දේසි ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය වූ නිසා
(4) උඩරටට හමුදා යැවීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ නිසා

● පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරින් **27** සහ **28** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සර්ව ජන ඡන්දබලය
B – ජාතික රාජ්‍ය සභාව
C – ජනමත විචාරණය
D – සෙනෙට් සභාව
E – සමානුපාතික නියෝජන ක්‍රමය

**27.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධ තොරතුරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා E

**28.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) B හා C (2) B හා D (3) C හා D (4) C හා E

**29.** ඉංග්‍රීසීන්ට, උඩරට යටත් කර ගැනීමේ ව්‍යාපාරයේ දී උපායශීලී ලෙස කටයුතු කිරීමෙන් දායකත්වයක් සැපයූ පුද්ගලයා ලෙස සැලකෙනුයේ,
(1) මේජර් හුක් ය. (2) ඇහැලේපොළ අදිකාරම් ය.
(3) ජෝන් ඩොයිලි ය. (4) රොබට් බ්‍රවුන්රිග් ය.

**30.** ශ්‍රී ලංකාවේ බිහි වූ පැරණිත ම දේශපාලන පක්ෂය වන්නේ,
(1) ලංකා සමසමාජ පක්ෂයයි. (2) එක්සත් ජාතික පක්ෂයයි.
(3) ලංකා කොමියුනිස්ට් පක්ෂයයි. (4) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

EXAMMOOD.LK

**31.** ශ්‍රී ලංකාවේ පිහිටි ගොවිජනපද කිහිපයක් පහත දැක්වේ.

A – ගල්ඔය B – මින්නේරිය

C – කන්තලේ D – මිනිපේ

E – ගිරිතලේ

ඉහත ගොවිජනපද අතුරෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර ආරම්භ කරන ලද ඒවා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා E (2) B හා C (3) B හා D (4) C හා D

**32.** හෙන්රි ස්ටීල් ඕල්කොට්, අනගාරික ධර්මපාල, ආරුමුග නාවලර් හා සිද්දි ලෙබ්බෙ යන පුද්ගලයන්ගේ කටයුතුවල පොදු ලක්ෂණය වන්නේ,

(1) ආගමික හා අධ්‍යාපනික පුනරුදයේ මූලිකත්වය දැරීම ය.
(2) ශ්‍රී ලාංකික අතීත ශ්‍රී විභූතිය ලොවට පෙන්වීම ය.
(3) අමද්‍යප ව්‍යාපාරයේ මූලිකත්වය දැරීම ය.
(4) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කිරීම ය.

**33.** මධ්‍යතන යුගයේ දී යුරෝපයේ ඇරඹි පුනරුදය නිසා විවිධ ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් සිදු විය. ලියනාඩෝ ඩා වින්චි ප්‍රසිද්ධියට පත්වූයේ මින් කවර ක්ෂේත්‍රයක ද?

(1) වෛද්‍ය විද්‍යාව (2) චිත්‍ර කලාව (3) දේශ ගවේෂණය (4) සාහිත්‍යය

**34.** විවිධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් පහත සඳහන් වේ.

A - සැමුවෙල් මෝර්ස්
B - රොබට් ෆුල්ටන්
C - හම්ප්‍රි ඩේවි
D - ගුග්ලි මාර්කෝනි
E - ජෝන් මැකඩම්

ඉහත පුද්ගලයන් අතුරෙන් කාර්මික විප්ලව සමයේ සන්නිවේදන ක්ෂේත්‍රය හා සම්බන්ධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා C ය. (2) A හා D ය. (3) B හා E ය. (4) C හා E ය.

**35.** කාර්මික විප්ලවය නිසා වර්ධනය වූ සමාජ ප්‍රතිඵලයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) භාණ්ඩ හා සේවා, ලාභයටත් ඉක්මනටත් මහා පරිමාණයටත් සැපයීමට හැකිවීම
(2) බහුජාතික ව්‍යාපාර වර්ධනය වීමට පටන් ගැනීම
(3) නාගරීකරණයේ වර්ධනය වේගවත් වීම
(4) මූල්‍ය හා බැංකු සේවා පුළුල් වීමට පටන් ගැනීම

● පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර **36** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. යුද ගැටුම්
2. පරිසර දූෂණය

B – 1. නාසිවාදය
2. හිට්ලර්

C – 1. මාර්ෂල් සැලැස්ම
2. ඇමෙරිකා එක්සත් ජනපදය

D – 1. පළමුවන ලෝක මහා සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

**36.** පළමුවැන්නේ වැඩි වීම දෙවැන්න ඉහළ යාමට හේතු වන බව පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**37.** පළමුවැන්නේ වර්ධනයත් සමග දෙවැන්නේ බලවත් වීම පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් **නොපෙන්වන** ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**39.** දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී කොළඹ හා ත්‍රිකුණාමලය යන නගරවලට ගුවන් ප්‍රහාර එල්ල කළ රට කුමක් ද?

(1) ඇමෙරිකා එක්සත් ජනපදය (2) ජර්මනිය
(3) ජපානය (4) ඉතාලිය

**40.** නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කළ දකුණු ආසියානු රාජ්‍ය නායකයා මින් කවරෙක් ද?

(1) මාෂල් ටිටෝ (2) ජවහර්ලාල් නේරු (3) අබ්දුල් ගමාල් නසාර් (4) ලී ක්වාං යූ

* * *

EXAMMOOD.LK EXAMMOOD.LK

239533

OL/2016/33/S-II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | |
|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

* I කොටසේ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** ද, III කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

**1.** (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දැදුරු ඔය, ගල් ඔය, ලංකාපටුන, හලාවත, කතරගම, සෙංකඩගල, බුත්තල, ඉබ්බන්කටුව, යෝධ වැව, නල්ලූර්, කලා වැව, ඌරාතොට (ලකුණු 12 යි)

(ii) මදුරාසිය (චෙන්නායි), පර්සියන් බොක්ක, ජාවා දූපත, ඉතාලිය, කැලිකට්, කොන්ස්තන්තිනෝපලය (ලකුණු 06 යි)

(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ඉන්දියාවට ගොඩ බැස තමන් ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා පැමිණි බව ප්‍රකාශ කළ නැනැත්තා

*B* - 'තිලෝක සුන්දරී' නමැති කාලිංග කුමරිය විවාහ කර ගත් පොළොන්නරු පාලකයා

*C* - මෙරට පාලනය කළ පළමු ලම්බකර්ණ රජතුමා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ ඉතාලි ෆැසිස්ට් පාලකයා (ලකුණු 04 යි)


● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' වලින් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

2. මෙය සොයා ගන්නා ලද්දේ කවර ස්තූපයක කරන ලද කැණීමකින් ද?

3. මෙම නිර්මාණය නිර්මිත ලෝහය කුමක් ද?

4. මෙම පුරාවස්තුව සොයා ගත් ස්ථානයේ දී උපත ලැබුවේ යැයි සැලකෙන රජතුමාගේ නම කුමක් ද? (ලකුණු 04 යි)




*A*

(iii) 1. '*B*' වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?

2. මෙය කිනම් ආගමකට අයත් ද?

3. මෙය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක ද?

4. මෙය ගොඩනගන ලද්දේ ශ්‍රී ලංකාව යටත් කර ගත් කවර විදේශීය පාලකයන් විසින් ද? (ලකුණු 04 යි)



*B*

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**2.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත්වූ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි සැලකෙන වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** සහ ගල් ගුහා වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව ඔවුන් ජීවත් වූ විවිධ පරිසරයන්ට අනුව හැඩ ගැසී තිබූ ආකාරය නිදසුන් **දෙකක්** දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත්වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවා දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) මෙරට ශිලා ලිපිවල සඳහන් තොරතුරුවලට අනුව පහත $A$, $B$ හා $C$ වලින් දැක්වෙන එක් එක් පුද්ගලයන්ගේ තනතුරු නාම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

$A$ - පවුලක ප්‍රධානියා

$B$ - ගමක ප්‍රධානියා

$C$ - ගම් කිහිපයක හෝ වැව් පද්ධතියක ප්‍රධානියා (ලකුණු 03 යි)

(ii) මධ්‍යම පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්ය භාර වූ තැනැත්තන්ගේ නිල නාම මොනවා දැයි වරහන් තුළින් තෝරා $A$, $B$, $C$ හා $D$ අනුපිළිවෙළින් ලියා දක්වන්න.

$A$ - ඇමති මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම

$B$ - රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධව කටයුතු කිරීම

$C$ - නගරයේ පාලනය සම්බන්ධව කටයුතු කිරීම

$D$ - රජුගේ ඇතුන් සම්බන්ධව කටයුතු කිරීම

(වෙදනා, මහමත, බඩගරික, ශෙනපති, හති අදෙක, නගරගුතික, අස අදෙක, බතගු) (ලකුණු 04 යි)

(iii) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වසභ රජතුමා මෙරට බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

**4.** (i) ඇළහැර ඇළ මගින් ජලය සපයනු ලබන වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත $A$ සිට $D$ දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

$A$ - මහියංගනයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස්කොට තැනූ අමුණ

$B$ - කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාම සඳහා නිර්මාණය කළ ඇළ

$C$ - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය." යන අදහස දැරූ රජතුමා

$D$ - වර්ෂා ජලයෙන් පෝෂණය වන කුඩා වැව් පද්ධතියක් හඳුන්වනු ලබන නම (ලකුණු 04 යි)

(iii) (a) වැවක ප්‍රධාන තාක්ෂණික අංග **දෙකක්** නම් කරන්න.

(b) ඔබ ඉහත (a) හි නම් කළ, එක් තාක්ෂණික අංගයක නිර්මාණය හා ප්‍රයෝජන පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව මහා පරිමාණ වාරිමාර්ග ක්‍රම බිහි නොවූයේ ඇයි දැයි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) පහත $A$, $B$ හා $C$ යටතේ දක්වා ඇති කාර්ය හා සම්බන්ධ වන පාලකයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න.

$A$ - අනුරාධපුරය සියලු නගරාංගවලින් යුත් පාලන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම

$B$ - සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම

$C$ - රජරට චෝල ආධිපත්‍යයෙන් මුදා ගෙන, පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීම (ලකුණු 03 යි)

(ii) $A$ - ඓතිහාසික මායා රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

$B$ - ඓතිහාසික මලය රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ යුගයේ පාලන මධ්‍යස්ථාන තෝරා ගැනීම සම්බන්ධයෙන් බලපෑ මූලික කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට තුඩු දුන් සාධක **තුනක්** දක්වා, ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

/තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

6. (i) *A* - මුල්වරට මහනුවර ස්වාධීන රාජධානියක් පිහිටු වූ රජතුමා
*B* - ක්‍රි.ව. 1580 දී උඩරට ආක්‍රමණය කළ සීතාවක පාලකයා
*C* - දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබූ කරලියද්දේ බණ්ඩාරගේ දියණිය
කවුරුන් දැයි *A*, *B* හා *C* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) *A* - රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම්
*B* - බෞද්ධ විහාරවල නඩත්තුව සඳහා පූජා කළ ඉඩම්
*C* - රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ලබා දුන් ඉඩම්
*D* - දේවාලවල නඩත්තුව සඳහා වෙන් කළ ඉඩම්
කවර නම්වලින් හැඳින්වූයේ දැයි *A*, *B*, *C* හා *D* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජධානියේ තම නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පෘතුගීසි හා ලන්දේසි ජාතිකයන් විසින් මහනුවර රාජධානිය යටත් කර ගැනීමට කරන ලද ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිටුවනු ලැබූ වෙළෙඳ මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කර ගත් බ්‍රිතාන්‍යයන්ට, මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට අවශ්‍ය වූයේ ඇයි දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයක් ඇති වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න.(ලකුණු 06 යි)

## III කොටස

8. (i) ප්‍රංශ විප්ලවයට බලපෑ මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයන් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති තොරතුරුවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.
*A* - ඇමෙරිකන් විප්ලවය ඇරඹීමට මුල් වූ සිදුවීම
*B* - නිදහස් ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා
*C* - ප්‍රංශ විප්ලව සමයේ එරට සිටි පාලකයා
*D* - රුසියන් විප්ලවයට නායකත්වය දුන් පුද්ගලයා
(වී.අයි. ලෙනින්, දහසයවන ලුවී, නැපෝලියන් බොනපාට්, බොස්ටන් තේ සාදය, ටෙනිස් පිටියේ දිවුරුම, ජෝර්ජ් වොෂින්ටන්, ඒබ්‍රහම් ලින්කන්, ලියෝන් ට්‍රොට්ස්කි) (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවයෙන් පසු එරට ඇතිවූ වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවය නිසා එරට ඇතිවූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් එක බැගින් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

9. (i) යටත් විජිත ඇති කර ගත් යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා, අනුපිළිවෙළින් ලියා දක්වන්න.
*A* - කුඩා රාජ්‍ය කිහිපයක් එකතු කොට ජර්මනිය නමින් රටක් බිහි කළ තැනැත්තා
*B* - යටත් විජිත ඇති කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ ජර්මන් අධිරාජයා
*C* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැතිවරයා
*D* - දෙවන ලෝක මහා සංග්‍රාමය අවසානයේ දී කොන්දේසි විරහිතව යටත් වීමේ ගිවිසුමට අත්සන් කළ ජපන් අධිරාජයා
(හිරෝහිතෝ, මුට්සුහිතෝ, වින්ස්ටන් චර්චිල්, ලොයිඩ් ජෝර්ජ්, දෙවන විලියම් කයිසර්, ඔටෝ වොන් බිස්මාර්ක්, ඇඩොල්ෆ් හිට්ලර්, ජෝෂප් ස්ටාලින්) (ලකුණු 04 යි)

(iii) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

* * *

EXAMMOOD.LK

EXAMMOOD.LK
EXAMMOOD.LK

239532

OL/2016/33-STE-II/(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved/

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 STE II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. ..............................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)

